# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2076/43 - 2018 ජුනි මස 23 වැනි සෙනසුරාදා - 2018.06.23

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

## පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත යටතේ දැන්වීම්

**(262 අධිකාරය) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 66අ (1) (අ) වගන්තිය යටතේ මාන්තෙයි බටහිර ප්‍රාදේශීය සභාවේ සභික ධූරයේ පුරප්පාඩුවක් පිරවීම**

ඉල්ලා අස්වීම හේතුකොට ගෙන මාන්තෙයි බටහිර ප්‍රාදේශීය සභාවේ සභික ධූරයක් පුරප්පාඩු වී ඇති හෙයින් ද;

ඉහත කී ආඥාපනතේ 66අ (1) (අ) වගන්තිය යටතේ මාන්තෙයි බටහිර ප්‍රාදේශීය සභාවේ අංක 04 - විඩත්තල්තීවු කොට්ඨාසයට තේරී පත් වූ අබ්දුල් හමීදු සනූස් අයත් වන්නා වූ එක්සත් ජාතික පක්ෂය නම්වන පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම්ට දින තිහ (30) ක කාල පරිච්ඡේදය ඇතුළත පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (262 අධිකාරය) 9 වන වගන්තිය යටතේ නුසුදුස්සෙකු වී නොමැති අපේක්ෂකයෙකු, සභිකයෙකු වශයෙන් තෝරා පත්කර ගනු ලැබිය යුතු යැයි ප්‍රකාශ කරනු ලැබිය යුතු වූ ද, එම පක්ෂයට අයත් වන්නාවූ ද, එම මාන්තෙයි බටහිර ප්‍රාදේශීය සභාවේ අංක 04 - විඩත්තල්තීවු කොට්ඨාසයේ සභිකයා පිළිබඳව තීරණය කිරීමට මා විසින් නියම කරනු ලැබ ඇති හෙයින් ද ;

ඉහත කී පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම් විසින් ඒ පුරප්පාඩුව පිරවීම සඳහා සවේරියාන් ෆර්දිනන් නම් කිරීමේ ස්වකීය තීරණය දන්වනු ලැබ ඇති හෙයින් ද ;

මාන්තෙයි බටහිර ප්‍රාදේශීය සභාවේ තේරීම්භාර නිලධාරි සමරසිංහ අප්පුහාමිලාගේ දර්ශ ප්‍රවීන වන මම, පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (262 අධිකාරය) 66අ (1) (අ) වගන්තිය ප්‍රකාර ක්‍රියා කරමින් සවේරියාන් ෆර්දිනන්, මාන්තෙයි බටහිර ප්‍රාදේශීය සභාවේ අංක 04 - විඩත්තල්තීවු කොට්ඨාසයේ සභිකයා වශයෙන් තෝරා පත්කර ගත්බව මෙයින් දැන් ප්‍රකාශ කරමි.

එස්. ඒ. දර්ශ ප්‍රවීන,
තේරීම්භාර නිලධාරී,
මාන්තෙයි බටහිර ප්‍රාදේශීය සභාව.

2018 ජුනි මස 21 වැනි දින,
දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය,
මන්නාරම.

07-257

1A - G 27926 — 17 (2018/06) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*